# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/ (VOL - II)

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2021.12. 09

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 05/2021**

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය</u>**

**<u>වත්කම් වාර්තා කිරීමේ මූල්‍ය සීමාව හඳුන්වාදීම හා වත්කම් තක්සේරු කිරීම</u>**

රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා අවශ්‍යවන උපදෙස්, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය හා 2019 ජූනි 04 දිනැති අංක 02/2019 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් ලබාදී ඇත.

02. අංක 04/2018 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයෙහි සඳහන් පරිදි සෑම වර්ෂ 05 කට වරක්ම මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේදී , අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන වටිනාකම තක්සේරු කල යුතු වේ. කෙසේ වෙතත්, අදාල කාලය තුල මෙම වත්කම්වල වටිනාකම ප්‍රමාණාත්මකව වෙනස්වීමට බලපාන සිදුවීමක් සිදුවී ඇත්නම්, එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන වටිනාකම තක්සේරු කල යුතු වේ. තවද, එලෙස වටිනාකම වෙනස්වූ වත්කමෙහි වටිනාකම නැවත තක්සේරු කිරීම, ප්‍රායෝගිකව ඵලදායී වන ලෙස, නව තක්සේරු කිරීම සිදුකල වර්ෂයේ සිට හෝ ඊට පෙර ආසන්නතම තක්සේරු කිරීම සිදුකල වර්ෂයේ සිට වසර 05 ක් සම්පූර්ණ වන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකල හැකි වේ.

03. රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරීම අනිවාර්ය කාර්යයක් වන බැවින්, ඉහත මාර්ගෝපදේශයෙහි දක්වා ඇති කම්ටුවලට අදාලව පහත සඳහන් ගෙවීම් පමණක් කල හැකි වේ:

(අ) 1.3.3 ඡේදයෙහි සඳහන් කමිටුව සඳහා බාහිර ආයතනයක් ලෙස මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් සහභාගී වන මෝටර් රථ පරීක්ෂක නිලධාරී සඳහා පමණක්, අදාල වියදම් පියවාගැනීම සඳහා;

i) එක් ආයතනයක පවතින අදාල වර්ෂයේ වටිනාකම තක්සේරු කල යුතු වාහන සංඛ්‍යාව 10ක් හෝ ඊට අඩු වන්නේනම්, ඒ සඳහා පත්කරනු ලබන කමිටුවේ අවසන් වාර්තාව වෙනුවෙන් රු. 500.00 ක දීමනාවක්.

ii) එක් ආයතනයක පවතින අදාල වර්ෂයේ වටිනාකම තක්සේරු කල යුතු වාහන සංඛ්‍යාව 10කට වැඩි වන්නේනම්, අදාල තක්සේරු කමිටු අවසන් වාර්තාවල සඳහන් එක් වාහනයකට රු. 50.00 ක් බැගින් වන දීමනාවක්.

(ආ) පහත සඳහන් කමිටු සඳහා අවස්ථාවෝචිත පරිදි විශේෂ දැනුමක් ඇති නිලධාරියෙකු යොදවාගැනීම වෙනුවෙන් අදාල අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අනුමත කරනු ලබන උචිත දීමනාවක්;

i) 1.3.5 ඡේදයෙහි සඳහන් විශේෂ වාහන තක්සේරු කිරීමේ කමිටුව සඳහා අවශ්‍ය වන විශේෂ දැනුමක් ඇති නිලධාරි සඳහා පමණක්.

ii) 4.2. 2වන කාණ්ඩයට අයත් පිරියත හා යන්ත්‍රෝපකරණ වසර 05 කට වරක් තක්සේරු කිරිම සඳහා 4.2.1 ඡේදයෙහි සඳහන් පරිදි වන කමිටුව අදාල කරගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන විශේෂ දැනුමක් ඇති නිලධාරි සඳහා පමණක්.

එස්.ආර්. ආටිගල

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1 ජනාධිපති ලේකම්

2 අග්‍රාමාත්‍ය ලේකම්

3 අමාත්‍ය මණ්ඩල ලේකම්

4 විගණකාධිපති

5 අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

6 අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

7 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්